සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

- **අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01 ඉන්දියානු ජාතික ව්‍යාපාරයට සමගාමීව ඉන්දියාවේ මුස්ලිම්වරුන් සඳහා වෙනම රාජ්‍යයක් අවශ්‍ය බව කියමින් දැඩි ස්ථාවරයක සිටි මුස්ලිම් නායකයා නම්

(1) මොහමඩ් ඉක්බාල් (2) මොහමඩ් අලිජින්නා

(3) ශ්‍රීමත් රාජගෝපාලචාරී (4) එස්. එන්. දාස්

02 බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ සියලුම දරුවන්ට සමාන අධ්‍යාපන අවස්ථා ලබාදීමට පියවර ගනිමින් නිදහස් අධ්‍යාපන පණත සම්මත කිරීමට ක්‍රියා කළේ,

(1) ජේම්ස් ද අල්විස් (2) මුතු කුමාරස්වාමි

(3) ආර්. එෆ්. මෝර්ගන් (4) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර

03 තම අයිතිවාසිකම් ඉල්ලමින් ශ්‍රී ලංකාවේ මුලින්ම වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කළේ,

(1) කොළඹ මුද්‍රණකරුවන් ය. (2) කොළඹ කරත්තකරුවන් ය.

(3) වැල්ලවත්ත රෙදි මෝලේ කම්කරුවන් ය. (4) රෙදි සෝදන්නන් ය.

04 ශ්‍රී ලංකාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීමට ක්‍රියා කළ ආණ්ඩුකාරයා වන්නේ,

(1) විලියම් ග්‍රෙගරි (2) වෙස්ට් රිජ්වේ

(3) ආතර් ගෝඩ්න් (4) හර්ක්‍යුලීස් රොබින්සන්

05 ශ්‍රී ලංකාවේ මුලින්ම මහ නගර සභාවක් පිහිටුවන ලද්දේ

(1) 1865 දී කොළඹ නගරයේ ය. (2) 1866 දී මහනුවර නගරයේ ය.

(3) 1860 දී ගාල්ල නගරයේ ය. (4) 1848 දී යාපනය නගරයේ ය.

06 රාජ්‍ය මන්ත්‍රණ සභාව නම් පාලන ආයතනයක් අප රටේ ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබුයේ,

(1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගිනි. (2) මැකලම් ප්‍රතිසංස්කරණ මගිනි.

(3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගිනි. (4) සෝල්බරි ප්‍රතිසංස්කරණ මගිනි.

07 මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල විශේෂ ලක්ෂණය නම්

(1) නිල ලත් සංඛ්‍යාව තවදුරටත් බහුතරය වීමයි.

(2) ඡන්ද බලයෙන් මන්ත්‍රීවරුන් 16 ක් තෝරාගැනීමයි.

(3) සීමිත ඡන්ද බලයක් මුල්වරට හඳුන්වාදීමයි.

(4) ජනවාර්ගික නියෝජනය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමයි.

08 1818 නිදහස් අරගලය අසාර්ථක වීමට ප්‍රධාන හේතුවක් වූයේ,

(1) උඩරට ජනයා අරගලය පාවාදීමයි.

(2) උඩරට ප්‍රදේශ සම්බන්ධ කරන මාර්ග පද්ධතියක් නොතිබීමයි.

(3) මොල්ලිගොඩ නිළමේ ඉංග්‍රීසීන්ට පක්ෂව කටයුතු කිරීමයි.

(4) හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් මුහන්දිරම්ගේ මරණයයි.

09 ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් පිළිමතලව්වේගෙන් පසුව උඩරට මහඅධිකාරම් තනතුරට පත්කරන ලද්දේ,

(1) මොල්ලිගොඩ මහ අධිකාරමයි. (2) කැප්පෙටිපොළ නිළමේ තුමායි.

(3) මඩුගල්ලේ නිළමේ තුමායි. (4) ඇහැලේපොළ නිළමේ තුමායි.

10 ශ්‍රී ලංකාවේ කම්කරුවන් සංවිධානය කළ මුල්ම දේශපාලන පක්ෂය වූයේ,

(1) එක්සත් ජාතික පක්ෂයයි.(2) ලංකා සම සමාජ පක්ෂයයි.

(3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. (4) ලංකා කම්කරු පක්ෂයයි.

11 ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ A තීරුවේ සඳහන් සිදුවීම්වලට ගැළපෙන පුද්ගලයින් B තීරුවෙන් ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | තරුණ බෞද්ධ සංගමය | A | මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි |
| 2. | මහා බෝධි සංගමය | B | හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා |
| 3. | පානදුරා වාදය | C | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| 4. | විද්‍යෝදය පිරිවෙණ | D | ඩී. බී. ජයතිලක මැතිතුමා |
| 5. | පරම විඥානාර්ථ සමාගම | E | අනගාරික ධර්මපාල තුමා |

(1) D E B A C (2) A C D B E (3) D E A C B (4) D E A B C

12 වෝල්ටෙයාර්, මොන්ටෙස්ක්‍යු හා රූසෝ යනු
(1) ප්‍රංශ ජාතික දාර්ශනිකයින් තිදෙනෙකි.
(2) ඉංග්‍රීසි ජාතික ගත් කතුවරුන් තිදෙනෙකි.
(3) ජර්මන් ජාතික විද්‍යාඥයින් තිදෙනෙකි.
(4) ඉංග්‍රීසි විප්ලවයට අනුරූපව ජනයාගේ අදහස් වෙනස් කිරීමට උත්සුක වූ තිදෙනෙකි.

13 යුරෝපයේ විවිධ ප්‍රදේශවල විසිරී සිටි ජර්මන් ජනතාව එක්සත් කරමින් එක්සත් ජර්මන් අධිරාජ්‍යයක් ගොඩනැගීමට ක්‍රියා කළේ,
(1) විලියම් කෛසර් (2) ඔටෝ පොන් බිස්මාර්ක්
(3) ගැරිබෝල්ඩි (4) ජෝශප් මැසිනි

14 ලෝක මහා සංග්‍රාම දෙක අතර කාලයේ යුරෝපා දේශපාලනය සම්බන්ධ වැදගත් සිදුවීමක් වනුයේ,
(1) ජර්මනියේ නාසිවාදය හා ඉතාලියේ පැසිස්ට්වාදය ක්‍රියාත්මක වීමයි.
(2) ජර්මනිය විසින් සෝවියට් රුසියාව ආක්‍රමණය කරනු ලැබීමයි.
(3) ඉතාලිය හා පෝලන්තය අතර සාම ගිවිසුමක් ක්‍රියාත්මක වීමයි.
(4) බර්ලින් සිට බැග්ඩෑඩ් දක්වා දුම්රිය මාර්ගයක් තැනීමයි.

15 දෙවන ලෝක සංග්‍රාමය වන විට A තීරුවේ රටවලට අදාළ නායකයින් B තීරුවෙන් තෝරා ගලපන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | මහා බ්‍රිතාන්‍යය | A | ඇඩොල්ෆ් හිට්ලර් |
| 2. | ඇමෙරිකා එක්සත් ජනපදය | B | චාල්ස් ඩිගෝල් |
| 3. | ප්‍රංශය | C | වින්ස්ටන් චර්චිල් |
| 4. | ජර්මනිය | D | බෙනිටෝ මුසොලිනී |
| 5. | ඉතාලිය | E | ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට් |

(1) E C B A D (2) C E B A D (3) A C B D E (4) A D C B E

16 ක්‍රි. ව. පළමුවන සියවසේ රජකම් කළ වසභ රජතුමාගේ රාජ්‍ය බලය දිවයින පුරා ව්‍යාප්තව පැවැති බව තහවුරු වන්නේ,
(1) එම කාලයට අයත් විවිධ ප්‍රදේශවලින් හමුවී තිබෙන සෙල්ලිපිවලින්ය.
(2) විවිධ ප්‍රදේශවල කරවා තිබෙන විහාරාරාමවලින් ය.
(3) සෑම ප්‍රදේශයකම කරවා තිබෙන වාරි කර්මාන්තවලින් ය.
(4) කුපික්කලතිස්ස හිමියන්ගේ වාර්තාවලින් ය.

17 අනුරාධපුර රාජධානි යුගයේ රාජත්වය හිමිවීම පිළිබඳව නිවැරදි ප්‍රකාශනය තෝරන්න.
(1) නිතරම රජකම උරුම වූයේ වැඩිමහල් සහෝදරයාගෙන් බාල සහෝදරයාටය.
(2) නිතරම රජකම උරුම වූයේ පියාගෙන් පුතාටය.
(3) සහෝදරයාගෙන් සහෝදරයාට හෝ පියාගෙන් පුතාට හෝ රජකම හිමිවූ අතර අග බිසවගේ පුතුන්ට පමණක් රජකම හිමිවිය.
(4) යුවරජු මායා රටේ පාලකයා වූ අතර මහ රජතුමා රජරට පාලනය කළේය.

18 බැබිරිය, කසුප්තොට ඇපා ආදී වශයෙන් මහා කවීන් දොළොස් දෙනෙකු සිටි බව සඳහන් වන්නේ,
(1) සිව්වන සේන රජුගේ කාලයේ දී ය. (2) පස්වන කාශ්‍යප රජුගේ කාලයේ දී ය.
(3) තුන්වෙනි දප්පුල රජුගේ කාලයේ දී ය. (4) පළමුවෙනි අග්බෝ රජුගේ කාලයේ දී ය.

19 ජානකීහරණ සන්නය, මේඝදූත සන්නය, සසදා සන්නය වැනි සන්න සාහිත්‍ය පොත් ජනප්‍රිය වූයේ,
(1) අනුරාධපුර යුගයේ දී ය. (2) දඹදෙනි යුගයේ දී ය.

(3) පොළොන්නරු යුගයේ දී ය. (4) කෝට්ටේ යුගයේ දී ය.

20 දකුණු ඉන්දියාවේ අමරාවතී කලා සම්ප්‍රදාය පෙන්නුම් කරන නිර්මාණයක් නම්
(1) අනුරාධපුරයේ සමාධි පිළිමයයි. (2) අවුකන පිළිමයයි.
(3) ඉසුරුමුනියේ මිනිසා හා අශ්ව හිසයි. (4) බිසෝ මාළිගයේ සඳකඩ පහණයි.

21 සුභ සෙන්පති, සංඛ සෙනෙවි, බුවනෙකබාහු ආදිපාද, තුන්වෙනි විජයබාහු යන පාලකයින් විසින් පිහිටුවා ගන්නා ලද පාලන මධ්‍යස්ථාන වන්නේ පිළිවෙලින්
(1) යාපහුව, මිණිපේ, ගෝවින්ද මලය හා දඹදෙනිය
(2) මිණිපේ, යාපහුව, දඹදෙනිය හා රයිගම
(3) යාපහුව, ගෝවින්ද මලය, දඹදෙනිය හා කෝට්ටේ
(4) කුරුණෑගල, දඹදෙනිය, යාපහුව හා රයිගම

22 කෝට්ටේ රාජධානි යුගයේ ලියැවී ඇති සාහිත්‍ය කෘති පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) හංස සංදේශය, මයුර සංදේශය, කව් සිළුමිණ
(2) ගුත්තිල කාව්‍යය, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය
(3) ලෝවැඩ සඟරාව, පැරකුම්බා සිරිත, විසුද්ධිමාර්ග සන්නය
(4) සද්ධර්මාලංකාරය, ලෝවැඩ සඟරාව, පැරකුම්බා සිරිත

23 දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයට අයත් ලෝදි රාජ වංශයේ අවසාන පාලකයා වන්නේ,
(1) ඊබ්‍රහිම් ලෝදි (2) අලාම් ලෝදි
(3) බහලොල් ලෝදි (4) සිකන්දර් ලෝදි

24 මධ්‍යතන යුගයේ යුරෝපා රටවල පැවැති ලක්ෂණ අතුරින් සමාජයීය ලක්ෂණයක් වන්නේ,
(1) ප්‍රවේණිවල ඉඩම් තීරු වශයෙන් වෙන්කර දාසයන් අතර බෙදාදීම.
(2) ප්‍රාදේශීය පාලකයින් සතු පෞද්ගලික හමුදාව
(3) අධිකරණ කටයුතු වංශාධිපතිවරුන් සතුවීම
(4) උත්පත්තිය මත සමාජ තරාතිරම හිමිවීම

25 A තීරුවේ සඳහන් දේශ ගවේශකයින්ට ගැළපෙන සොයාගැනීම් B තීරුවෙන් තෝරා නිවැරදි පිළිතුර සොයන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | බර්තොලමියු ඩයස් | A | ඉන්දියාව |
| 2. | ක්‍රිස්ටෝපර් කලම්බස් | B | පිලිපීනය |
| 3. | වස්කෝ ද ගාමා | C | ඇමෙරිකාව |
| 4. | පර්ඩිනන්ඩ් මැගලන් | D | කුණාටු තුඩුව |
| 5. | ඇමෙරිගෝ වෙස්පුචි | E | හිස්පැණියෝලාව |

(1) D E B A C (2) D E A B C (3) B D E A C (4) A B C D E

26 යුරෝපා රටවල ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේදී ජර්මනිය, ඉතාලිය හා ප්‍රංශය යන රටවලින් මූලිකත්වය ගත් පුද්ගලයින් වන්නේ පිළිවෙලින්,
(1) ජෝන් කැල්වින්, මාටින් ලූතර් හා ජෝන් හස්
(2) මාටින් ලූතර්, උල්රිච් ස්වින්ග්ලි හා ජෝන් කැල්වින්
(3) ජෝන් වයික්ලිෆ්, ජෝන් හස් හා ඉරාස්මස්
(4) ඉරාස්මස්, ජෝන් කැල්වින් හා උල්රිච් ස්වින්ග්ලි

27 යුරෝපා ජාතීන්ගේ බල ව්‍යාප්තිය සම්බන්ධව කියැවෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්පාඤ්ඤ ජාතිකයෝ අත්ලාන්තික් සාගරයේ බටහිරට යාත්‍රාකරමින් මධ්‍යම හා දකුණු ඇමෙරිකානු ප්‍රදේශ සොයාගත්හ.
(2) පාප්වහන්සේගේ තීරණයක් අනුව ස්පාඤ්ඤය හා ප්‍රංශය අතර දේශ ගවේෂණය සඳහා කලාප බෙදා දෙන ලදී.
(3) පෘතුගීසි ජාතිකයින් වැඩිපුරම අවධානය යොමුකළේ ගිණිකොණ ආසියාතික ප්‍රදේශ වෙතයි.
(4) ප්‍රංශ ජාතිකයෝ වෙළඳ කටයුතු ගැන මිස ආගම ප්‍රචාරය කිරීම ගැන අවධානය යොමුකර නැත.

28 කාර්මික විප්ලව යුගයේ සොයාගැනීම් හා ඊට අදාළ පුද්ගලයින් නිවැරදිව දැක්වෙන පරිදි A හා B තීරු යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | විදුලි පණිවුඩ ක්‍රමය | A | ජේම්ස් හා ග්‍රීව්ස් |
| 2. | දුරකථනය | B | තෝමස් බෙල් |
| 3. | කටින ජෙනී | C | හම්ප්‍රි ඩේවි |
| 4. | සිලින්ඩර් මුද්‍රණ ක්‍රමය | D | ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් |
| 5. | ආරක්ෂක ලාම්පුව | E | සැමුවෙල් මෝර්ස් |

(1) E D A B C (2) E D C A B (3) E C D A B (4) A D C B E

29 කාර්මික විප්ලව යුගයේ විද්‍යාත්මක සමාජවාදය පිළිබඳ දර්ශනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) ඇඩම්ස්මිත් විසිනි. (2) ජෙරමි බෙන්තම් විසිනි.

(3) ජෝන් ස්ටුවට්මිල් විසිනි. (4) කාල් මාක්ස් විසිනි.

30 මහා විහාරයට එරෙහිව කටයුතු කිරීම පිණිස මහසෙන් රජතුමා පොළඹවන ලද්දේ,

(1) සංඝමිත්‍ර නම් මහායාන භික්ෂුවක් විසිනි. (2) කුපික්කල තිස්ස මහ තෙරුන් විසිනි.

(3) මේඝවර්ණාභය ඇමති විසිනි. (4) වෝහාරික තිස්ස තෙරුන් විසිනි.

31 පළමුවන විජයබාහු රජතුමා පිළිබඳව තොරතුරු සපයා ගතහැකි මූලාශ්‍රයක් නොවන්නේ,

(1) පනාකඩුව තඹ සන්නස (2) අඹගමුව සෙල්ලිපිය

(3) මහාවංශයේ දෙවන කොටස (4) දෙවනගල සෙල්ලිපිය

32 පුලහත්ථ, භාහිය, පනයමාර, පිළයමාර, දඨිය යන පස් ද්‍රවිඩයින් එකිනෙකා මරාගනිමින් අනුරාධපුරයේ පාලන බලය අල්ලාගත්තේ,

(1) වළගම්බා රජතුමාගේ කාලයේ දී ය. (2) මහසෙන් රජතුමාගේ කාලයේ දී ය.

(3) ධාතුසේන රජතුමාගේ කාලයේ දී ය. (4) ගෝඨාභය රජතුමාගේ කාලයේ දී ය.

33 කරින්ද නදී, ගල්භ නදී හා කදම්බ නදී ආශ්‍රිතව ඇතිවූ මුල් ආර්ය ග්‍රාම වන්නේ පිළිවෙලින්,

(1) උරුවෙලගාම, උපතිස්සගාම හා මහාගාම

(2) මහාගාම, දීඝගාම හා අනුරාධගාම

(3) චන්දනගාම, කාචරගාම හා විජිතගාම

(4) මහාගාම, කාචරගාම හා උරුවෙලගාම

34 ඉන්දියාවේ භාරුකච්ච හා සුප්පාරක වරායයන් ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ,

(1) භද්දකච්චායනා කුමරිය ඇතුළු පිරිස නැව්නැගීම නිසාය.

(2) විජය කුමරු ඇතුළු පිරිස නැව්නැගීම නිසාය.

(3) ශ්‍රී ලංකාව සමග නිරන්තර වෙළඳ සම්බන්ධතා පැවැත්වීම නිසාය.

(4) ඉන්දියාවේ විදේශ වෙළඳ කටයුතු කලක් පාලනය කිරීම නිසාය.

35 දුටුගැමුණු රජුගේ දසමහා යෝධයින් ගැන තොරතුරු සඳහන්වන සෙල්ලිපි දෙකක් වන්නේ,

(1) මිහින්තලා පුවරු ලිපිය හා කළුදිය පොකුණ ලිපිය

(2) පෙරිමියන්කුලම හා සිතුල්පව්ව සෙල්ලිපි

(3) සිතුල්පව්ව හා සංඝපාල විහාර සෙල්ලිපි

(4) කටුගහගල්ගේ හා අලවල අමුණ සෙල්ලිපි

36 සඳකඩ පහණ, දොරටුපාල රූප, කොරවක්ගල් ආදිය පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශයක් වන්නේ,

(1) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් වීමයි.

(2) සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට සමත්ව ඇති නටබුන් වීමයි.

(3) දේශීය සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂාකරන නිර්මාණ වීමයි.

(4) අතීත නිර්මාණ ශිල්පීන්ගේ දක්ෂතා අනාවරණය වීමයි.

37 ශ්‍රී ලංකාව හා වයඹදිග ඉන්දියාව අතර අතීතයේ පැවැති වෙළඳාම පිළිබඳව තොරතුරු සඳහන් වන විදේශීය කෘතියක් නම්

(1) ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (2) ප්‍රොකෝපියස්ගේ පර්සියානු යුද්ධ

(3) මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා (4) ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ

38 කුමාරදේවී නම් ලිච්ඡවි කුමාරිකාවක් සරණපාවා ගනිමින් ''මහාරාජාධිරාජ'' ලෙස විශාල ප්‍රදේශයක අභිෂේක ලැබූ ගුප්ත අධිරාජයා නම්

(1) පළමුවන චන්ද්‍රගුප්ත (2) දෙවෙනි චන්ද්‍රගුප්ත

(3) සමුද්‍රගුප්ත (4) කුමාරගුප්ත

39 රාජ කකුධ භාණ්ඩ ප්‍රයෝජනයට ගනිමින් දෙවන වරටත් විධිමත් අභිෂේක උත්සවයක් පැවැත්වූ අනුරාධපුර රජතුමා

(1) දුටුගැමුණු (2) වෝහාරිකතිස්ස (3) වංකනාසිකතිස්ස (4) දේවානම්පියතිස්ස

40 ඉංග්‍රීසීන් උඩරට රාජධානිය කෙරේ අවධානය යොමුකිරීම සම්බන්ධයෙන් බලනොපෑ කරුණ වන්නේ,

(1) කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිමින් සම්බන්ධතා පැවැත්වීමට අපහසු වීම.

(2) උඩරටට පිවිසෙන කඩවත්වලදී බදු ගෙවීමට සිදුවීම.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - II

**11 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- I කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර දෙවන කොටසින් ප්‍රශ්න 3 කටත්, තුන්වන කොටසින් ප්‍රශ්න දෙකකටත් බැගින් වනසේ ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.

## I කොටස

01 (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) වෙල්ලස්ස / මහානාගහුල / දීඝවාපී / ලංකාපටුන / සීගිරිය / පුලතිසිපුර / යෝධ ඇල / කන්දරෝඩෙයි / කල්‍යාණි නදී / ආලිසාර (ල. 10)

(ii) ගෝව / තාමුලිප්ති / ඊඩෝ / මලක්කා සමුද්‍ර සන්ධිය / රෝමය / දණ්ඩි වෙරළ / බෝල්ටික් මුහුද / බ්‍රිතාන්‍ය දූපත් (ල. 08)

(ආ) පහත A B C D වශයෙන් දක්වා ඇති වගන්තිවලට අදාළ ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙලින් ලියන්න.

A බටහිර ඉන්දියාවේ ශක-ශත්‍රප බලය බිඳදැමීමට ක්‍රියා කළ ගුප්ත අධිරාජයා

B දම්පිය අටුවා ගැටපදය රචනා කළ අනුරාධපුර රජතුමා

C කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික සේවාවට අනුග්‍රහය දුන් සංඝරාජ හිමිනම

D ශ්‍රී ලංකාවේ ගාලු වරායට සේන්දු වූ පළමුවන පෘතුගීසි ජාතිකයා (ල. 04)

(ඇ) පහත වූ පින්තූර ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C

(i) (a) A පින්තූරයෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?

(b) එතුමා රාජ්‍යය කළේ කවර රටක කවර රාජ්‍යයකද?

(c) එතුමාගෙන් එම රාජ්‍යයට සිදුවූ සේවාවක් සඳහන් කරන්න.

(ii) (a) B පින්තූරයෙන් පෙන්නුම් කරන ගොඩනැගිල්ල කුමක් ද?

(b) එය දක්නට ඇත්තේ කවර රටක කවර නගරයකද?

(c) එහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් ලියන්න.

(iii) (a) C අක්ෂරයෙන් පෙන්වා ඇති ගොඩනැගිල්ල කරවන ලද මහනුවර රජතුමා කවුරුන්ද?

(b) මේ හා සම්බන්ධ වැදගත් සංස්කෘතික අංගයක් නම් කරන්න. (ල. 08)

## II කොටස

02 (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ආගමික පුනර්ජීවනය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පුද්ගලයින් තිදෙනෙක් පහත ඇති පින්තූරවලින් පෙන්නුම් කෙරේ. එම පුද්ගලයින් A B C අනුපිළිවෙලින් නම් කරන්න.

A 

B 

C 

(ii) එකල බෞද්ධාගමික පුනර්ජීවනයට දායක වූ මහ පිරිවෙන් දෙක නම් කර ඒවායේ නිර්මාතෘවරුන් ද සඳහන් කරන්න.

(iii) දේශපාලන බලය අත්-පත් කර ගැනීමේ ක්‍රියාවලියට දේශීය නායකයින් පෙළගැස්වීම පිණිස අමද්‍යප ව්‍යාපාරයෙන් ලැබුණු පිටුවහල කෙබඳුදැයි පැහැදිලි කරන්න.

(iv) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට සංස්කෘතික පුනරුදයක් ඇතිවීමට බලපෑ සාධක 3 ක් පැහැදිලි කරන්න.

03 (i) මුහුදුබඩ ප්‍රදේශවල ජනයා බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව මුල්ම අරගලය දියත් කළේ 1797 දී ය. එයට මුල්වූ හේතු 3 ක් සඳහන් කරන්න.

(ii) එම අරගලය සංසිඳුවීම පිණිස මියුරන් සාමි ඉදිරිපත් කළ යෝජනා 2 ක් ලියන්න.

(iii) පළමුවන නිදහස් අරගලයට හා දෙවන නිදහස් අරගලයට බලපෑ ප්‍රධාන හේතු වෙන වෙනම විස්තර කරන්න.

(iv) අරගල දෙකම මර්දනය කිරීමේ දී පාලකයින් අනුගමනය කළ ක්‍රියාමාර්ගවල සාධාරණ හෝ අසාධාරණ භාවය පිළිබඳව විමසීමක් කරන්න.

04 (i) මෙරට ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනයා වාසය කළ බවට තොරතුරු ලැබී ඇති ස්ථාන 3 ක් සඳහන් කරන්න.

(ii) දකුණු පස ඇති ශ්‍රී ලංකා සිතියමේ A B C D වශයෙන් පෙන්නුම් කරන්නේ මෙරට මුල් ආර්ය ජනාවාස ඇතිවූ ස්ථානයන්ය. ඒවා අනුපිළිවෙලින් නම්



කරන්න.

(iii) අනුරාධපුර රාජධානිය වරින් වර දකුණු ඉන්දීය ආක්‍රමණවලට නතුවූ බව උදාහරණ දෙකක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(iv) රටේ ආර්ථික ස්ථාවරභාවය පවත්වා ගැනීමට අනුරාධපුර පාලකයින් ඇති ආකාරය අවස්ථා 3 ක් වත් ආශ්‍රයෙන් තහවුරු කරන්න.




05 (i) 1521 දී සිදුවූ විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය කොටස්වලට බෙදී ගිය අන්දම දකුණු පස ඇති ශ්‍රී ලංකා සිතියමෙන් පෙන්නුම් කෙරේ. එහි අංක 1, 2, 3 වශයෙන් පෙන්වා ඇති රාජධානි පිළිවෙලින් නම් කරන්න.

(ii) අංක 3 පාලන ප්‍රදේශයේ දේශපාලන බලය වර්ධනය කිරීමට පියවර ගත් පාලකයින් දෙදෙනෙක් නම් කරන්න.

(iii) 1562 දී සිදුවූ මුල්ලේරියා වෙලේ සටන ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වන්නේ මන්දැයි කරුණු 2 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

(iv) 1766 ගිවිසුමෙන් ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල දේශපාලන හා ආර්ථික කටයුතු පිළිබඳ අයිතිය බලහත්කාරයෙන් පවරාගත් බව එහි සඳහන් කරුණු 3 ක් ආශ්‍රයෙන් ඔප්පු කරන්න.

06 (i) (a) යාපනය රාජධානිය පිළිබඳව තොරතුරු සපයාගතහැකි මූලාශ්‍ර ග්‍රන්ථ දෙක නම් කරන්න.

(b) සිංහල හා දෙමළ වැසියන් අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන ගිය යාපනයේ රජතුමා කවුද?

(ii) පොළොන්නරු රාජධානිය පරිහානියට පත්වීමට බලපෑ හේතු 2 ක් දක්වන්න.

(iii) දඹදෙනි රාජධානි යුගයට අයත් වැදගත්ම රජතුමා නම් කර ඒ රජතුමාගෙන් ඉටුවූ සේවාවන් 2 ක් ක්ෂේත්‍ර 2 ක් ඔස්සේ පැහැදිලි කරන්න.

(iv) කෝට්ටේ හයවෙනි පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ දී ඉටුවූ වැදගත් දේශපාලන සිදුවීම් 3 ක් විස්තර කරන්න.

## III කොටස

07 (i) (a) පළමුවන ලෝක සංග්‍රාමයට තුඩුදුන් ප්‍රධාන හේතුව කුමක් ද?

(b) ඊට බලපෑ තවත් හේතු 2 ක් සඳහන් කරන්න.

(ii) පහත වරහන් තුළ දී ඇති රටවල් අතුරින් පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටවල් දෙකක්ද, මධ්‍යම බලවතුන්ගේ පිලේ රටවල් දෙකක් ද බැගින් තෝරා වෙන වෙනම ලියන්න.

(ජර්මනිය / ප්‍රංශය / මොරොක්කෝව / ස්පාඤ්ඤය / ඔස්ට්‍රියාව / මහා බ්‍රිතාන්‍ය)

(iii) ලෝක සාමය පවත්වාගෙන යාම පිණිස පසු කාලයේ පිහිටුවාගත් ජාතීන්ගේ සංගමයේ සාර්ථකභාවය හෝ අසාර්ථකභාවය කරුණු 2 ක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(iv) දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල කරුණු 3 ක් වත් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

08 (i) චීනයේ ජාතික ව්‍යාපාරය සම්බන්ධව පහත සඳහන් කාර්යයන් හා ගැළපෙන පුද්ගලයින් වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

(a) ක්වෝමින්ටාන් පක්ෂයට නායකත්වය දීම.

(b) චීන සමූහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපතිවරයා වීම.

(c) දීර්ඝ පා ගමන නිසා කොමියුනිස්ට් පක්ෂයේ අසහාය නායකයා වීම.

(යුවාං-ෂි-කායි / මා-ඕ-සේතුං / සුන්-යත්-සෙන්)

(ii) මෙයිජි පාලන ක්‍රමය යටතේ ජපාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැදගත් ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(iii) ඉන්දියානු ජනතාව තුළ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව අප්‍රසාදයක් වර්ධනය වීමට තුඩුදුන් හේතු 2 ක් පහදන්න.

(iv) ඉන්දියාවේ ජාතික ව්‍යාපාරය සම්බන්ධයෙන් මහත්මා ගාන්ධි තුමාගේ දායකත්වය කෙබඳු වී දැයි කරුණු 3 ක් වත් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

09 (i) (a) මධ්‍යතන යුගය අවසාන භාගයේ යුරෝපා රටවල ඇතිවූ පුනරුදය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

(b) ඊට බලපෑ ආසන්නතම හේතුව සඳහන් කරන්න.

(ii) පුනරුදයේ විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න.

(iii) පුනරුදයත් සමගම යුරෝපා රටවල වර්ධනය වූ ජාතික රාජ්‍යයන් තුළ දක්නට තිබූ ලක්ෂණ 5 ක් ලියන්න.

(iv) එකල විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ඇතිවූ ප්‍රබෝධය කරුණු 3 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

10 (i) ඉන්දියාවේ ආර්ය සංක්‍රමණය හා ව්‍යාප්තිය පිළිබඳව තාරතුරු සපයාගතහැකි මූලාශ්‍ර 3 ක් නම් කරන්න.

(ii) ඔවුන්ගේ සමාජ සංවිධානය පිළිබඳව කියැවෙන කරුණු 2 ක් ලියන්න.

(iii) මගධය අධිරාජ්‍යයක තත්ත්වයට පත්කිරීමට පියවර ගත් රජවරුන් දෙදෙනෙකුගේ ක්‍රියා කලාපය ඇගැයීමට ලක්කරන්න.

(iv) අශෝක අධිරාජයාගෙන් පසුව මෞර්ය අධිරාජ්‍යය ක්‍රමයෙන් පරිහානියට පත්වීමට හේතු වූ කරුණු 3 ක් විස්තර කරන්න.

01 (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම.



01 (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම.




e-තක්සලාව The National e-Learning Portal for General Education